2016 මාර්තු 29 දිනැති මෙහි ඉංග්‍රීසි පිටපත මත මෙම පරිවර්තිත ව.ද.ප පාදක වේ.

ADB ආසියානු සංවර්ධන බැංකුව

## ශ්‍රී ලංකාව: විදුලිබලය සැපයීමේ චිරස්තායීතාවය වැඩිදියුණු කිරීමට සහය වීම

| | |
|---|---|
| ව්‍යාපෘති නාමය | විදුලිබලය සැපයීමේ චිරස්තායීතාවය වැඩිදියුණු කිරීමට සහය වීම |
| ව්‍යාපෘති අංකය | 49216-001 |
| රට | ශ්‍රී ලංකාව |
| ව්‍යාපෘති තත්වය | අනුමැතිය ලැබී ඇත |
| ව්‍යාපෘති වර්ගය/ සහායේ ප්‍රකාරතාව | තාක්ෂණික සහය |
| අරමුදල් මූලාශ්‍රය / වටිනාකම | **TA 8952-SRI: විදුලිබලය සැපයීමේ චිරස්තායීතාවය වැඩිදියුණු කිරීමට සහය වීම**<br>තාක්ෂණික සහය විශේෂිත අරමුදල — ඇ.එ.ජ ඩොලර් 225,000.00 |
| ක්‍රමෝපාය න්‍යාය පත්‍ර | පාරිසරික වශයෙන් ධරණීය වර්ධනය<br>සමස්ත ආර්ථික වර්ධනය |
| වෙනස්වීමේ තීරක | පාලන සහ ධාරිතා සංවර්ධනය |
| ක්ෂේත්‍රය / අනුක්ෂේත්‍රය | **බලශක්තිය-** විදුලිබලය සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම- බලශක්ති කාර්යක්ෂමතාවය සහ සුරක්ෂිතතාවය- පුනර්ජනනීය බලශක්ති උත්පාදනය- සූර්යබලය- පුනර්ජනනීය බලශක්ති උත්පාදනය- සුළං |
| ස්ත්‍රී/පුරුෂ සමානතාවය සහ මුඛ්‍යධාරාව | ඇතැම් ලිංග මූලිකාංග |
| විස්තරය | ජනගහනයේ සියළුම දෙනාට බලශක්ති සේවා භාවිතයට ප්‍රවේශය සැලසීම සහ එකී සේවාවන් විශ්වාසදායී ලෙස වඩා තරගකාරී මිලකට සැපයීමට පහසුකම් සැලසීම සඳහා ‘ශ්‍රී ලංකා රජයේ සංවර්ධන ආකෘතිය’ බලශක්ති ක්ෂේත්‍රයේ ධරණීය සංවර්ධනය කෙරෙහි හොඳින් සූදානම් වෙයි. විදුලිය සඳහා ප්‍රවේශය ඉහළ නැන්වීම, ඉහළ යන විදුලි ඉල්ලුම සැලකියයුතු අවම පිරිවැයකට ලබාදීමේ අරමුණ ලඟාකර ගැනීම, වර්ධන අවස්ථාවන් සඳහා පුළුල් ප්‍රවේශය සහ දිගුකාලීන චිරස්ථායී අත්පත්කර ගැනීම, පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර (උදා., ජලවිදුලිය, සුළං, සූර්යතාපය, සහ වෙනත්) දායකත්වය ඉහළ නැන්වීම ඇතුළුව පද්ධතියේ සැපයුම් ධාරිතාවය ඉහළ නැන්වීමේ රජයේ සැලැස්ම, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ පද්ධතිය තුළ සිදුවන තාක්ෂණික සහ වාණිජමය අලාභ අවම කිරීම, සහ බලශක්ති කාර්යක්ෂමතා සහ සුරක්ෂිතතා ක්‍රියාමාර්ග ක්‍රියාවේ නැන්වීමයි. මෙම සැලසුම් වලට සහය වනුවස් ආයෝජන අවශ්‍යතා කෙරෙහි කටයුතු කිරීමට සලකාබැලීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් අදාල ආයෝජන ව්‍යාපෘතියක් සූදානම් කිරීමේ තාක්ෂණික සහය පිළියෙල කිරීම අවශ්‍යවී තිබේ. |

| | |
|---|---|
| ව්‍යාපෘති සාධාරණීකරණය සහ දේශීය/ කාලාපීය ක්‍රමෝපාය කෙරෙහි ඇති සම්බන්ධය | මෑත වසර කිහිපය තුළදී ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය දියුණුවී ඇති අතර 1990 දී 29% ක්ව පැවති ජාතික විදුලිබල ආවරණ අනුපාතය 2015 වන විට 98% දක්වා ලඟා වී ඇත. ඉතිරි 2% ලඟාකර ගැනීම ඉතාමත්ම අපහසු වන්නේ එකී ප්‍රදේශ පිහිටා ඇත්තේ රටේ ඌණ සංවර්ධිත ප්‍රදේශවල සහ හුදකලා දූපත් වල බැවිනි. රටේ ඇතැම් පලාත් සඳහා 100% ක විදුලිබල ආවරණ අනුපාතයක් පැවතියද, ගැටුම්වල බලපෑමට ලක්වූ උතුරු සහ නැගෙනහිර පලාත් වල පිළිවෙලින් පවතින්නේ 92% ක සහ 94% ක විදුලිබල ආවරණ අනුපාතයකි. එසේම ඌව සහ උතුරුමැද යන පලාත් 95% ක මට්ටමට ලඟාවූවත් ඇතැම් දිස්ත්‍රික්ක මෙම මට්ටමින් ඉතා පහළ මට්ටමක වේ. පද්ධතියේ විශ්වසනීයත්වය සහතික කිරීමට සහ බොහෝ දිළිඳු පවුල් තවදුරටත් සම්බන්ධ නොවූ පහත් ගුණත්වයකින් යුත් විදුලි සැපයුමක් ලබන බොහෝ කුටුම්භ සිටින ග්‍රාමීය ප්‍රදේශ වලට බලශක්ති සැපයුම් පුළුල් කිරීමට කිලෝවෝල්ට් (kV) 33 ක මධ්‍යම වෝල්ටීයතා (MV) ජාලය තවදුරටත් වැඩිදියුණු කිරීම අවශ්‍යය. ජාලකය පුළුල් කිරීම මගින් විදුලිබලය ලබාදිය නොහැකි, ජනගහනය 1,250 සිට 4,540 දක්වා ව්‍යාප්තවූ හුදකලා දූපත් ඇත. මේවාට දැනට අකාර්යක්ෂම, පැරණි ඩීසල් උත්පාදන යන්ත්‍ර පද්ධතියක් මගින් ලබා ගන්නා පිරිවැය අධික විදුලි බලය ලබා දේ. එලෙස විදුලිය ලබාදෙන්නේ දිනකට සීමිත පැය ගණනක් වන අතර විදුලිබල ආවරණ අනුපාතය 0% (එක් දූපතක) සිට 74% දක්වා සීමාවක පවතී. ශ්‍රී ලංකා රජය විසින් සමස්ත ජනගහනයට විදුලිබල සේවා සඳහා පවතින ප්‍රවේශය සනාථ කිරීම පිණිස බලශක්ති සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම මගින් බලශක්ති මූලාශ්‍රවල ධරණීය සංවර්ධනය සනාථ කිරීමට අරමුණු කරයි. ශ්‍රී ලංකාව සතුව ජාතික බලශක්ති ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය (National Energy Policy and Strategies- NEPS) මත පාදකවූ ක්ෂේත්‍ර ආයෝජන ඇතුලත් ජාතික ආයෝජන වැඩසටහනක් පවතී. ජාතික බලශක්ති ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය තුළ ක්ෂේත්‍ර මාර්ග සැලැස්ම, දිගුකාලීන ආයෝජන වැඩසටහනක්, සහ සුදුසු ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග පවතී. රටේ මේවන විට පිහිටුවා ඇති බලශක්ති උත්පාදන ධාරිතාවය මෙගාවොට් 3,932 (MW) ක් වන අතර ගිගාවොට්-පැය 12,357 (GWh) විදුලිබලයක් නිපදවයි (2014). උපරිම ඉල්ලුම (2014) වන්නේ මෙගාවොට් 2,152 කි . විදුලිබල සැපයුම තවදුරටත් පුළුල් කිරීමට ප්‍රමාණවත් උත්පාදන ධාරතාවයක් ඇත. ජනගහනය සඳහා රටේ ප්‍රධාන ජාලකය හරහා විදුලිබලය ලබාදීමට රජය බලාපොරොත්තුවන අතර කුඩා හුදකලා දූපත් සඳහා කුඩා-ජාල පද්ධති මගින් විදුලිබලය ලබා දේ. මෙම ව්‍යාපෘතිය විදුලිබලයට තිබෙන ප්‍රවේශය පුළුල් කිරීමට සහ සුපිරිසිදු බලශක්තිය දියුණු කිරීම කෙරෙහි පවතින රජයේ අරමුණ සඳහා දායකත්වය සපයයි. පසුගාමී ප්‍රදේශ සංවර්ධනයට ව්‍යාපෘතිය ඍජුව ප්‍රතිලාභ සපයයි. ව්‍යාපෘතිය 116 ක්වූ ග්‍රාමීය විද්‍යුතන වැඩසටහන් සහ කිලෝමීටර 2,150 ක්වූ අඩු වෝල්ටීයතාවයකින් යුත් රැහැන් පුළුල් කිරීම සිදු කරයි. බලශක්ති ගබඩාකිරීම (ලිතියම්-අයන් බැටරි) සහිතව සුළං සහ සූර්ය බලය සහ කාර්යක්ෂම ඩීසල් මගින් ක්‍රියාත්මකවන උත්පාදන පද්ධති රැගත් නවීන දෙමුහුන් කුඩා-ජාලක හුදකලා දූපත්වල ක්‍රියාත්මක කරනු ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් පූර්ණ ආවරණය සහ සියළුම ජනගහනයට විදුලිබලයට ප්‍රවේශය බලාදීමට ව්‍යාපෘතිය සහය දෙයි. සමස්තයක් වශයෙන් ව්‍යාපෘතිය උතුරු සහ නැගෙනහිර පලාත් මෙන්ම රටේ අනෙකුත් කොටස් වලට සාපේක්ෂව විදුලිබල ආවරණ අනුපාතය පහළ මට්ටමක පවතින ඌව සහ උතුරු මැද පලාත් ඇතුළුව 17,500 ක් පමණවූ ග්‍රාමීය පවුල් සඳහා විදුලිබලය සැපයීමට බලාපොරොත්තු වේ. ශ්‍රී ලංකාව සඳහාවන ආසියානු සංවර්ධන බැංකුවේ අතුරු රාජ්‍ය හවුල්කාර ක්‍රමෝපාය සමඟ ව්‍යාපෘතිය සමගාමී වේ. සුපිරිසිදු සහ විශ්වාසශීලී විදුලිබලයට පවතින ප්‍රවේශය පුළුල් කිරීමට සංප්‍රේෂණ සහ බෙදාහැරීමේ ආයෝජන සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයට සහය දැක්වීමට ශක්තිමත් පූර්ව ආසියානු සංවර්ධන බැංකුවේ මැදිහත්වීම් පවතී. |
| බලපෑම | |

**ව්‍යාපෘති ප්‍රතිඵල**

| | |
|---|---|
| ප්‍රතිඵල පිළිබඳ විස්තරය | |
| ප්‍රතිඵල දෙසටවූ ප්‍රගතිය | |
| **ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය** | |
| ව්‍යාපෘති ප්‍රතිඵල පිළිබඳ විස්තරය | |
| ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තත්වයන් (ප්‍රතිඵල, ක්‍රියාකාරකම් සහ කරුණු) | |
| භූගෝලීය පිහිටීම | |

**පාරිසරික සහ සාමාජයීය අංග පිළිබඳ සාරාංශය**

| | |
|---|---|
| පාරිසරික අංශය | |
| ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම | |
| ආදිවාසී ජනතාව | |

**පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය, සහභාගිත්වය සහ උපදේශනය**

| | |
|---|---|
| ව්‍යාපෘති සැලසුම්කරණ කාලය අතරතුර | ව්‍යාපෘතිය සකස් කිරීමේ තාක්ෂණික සහාය (PPTA) අතරතුර, සැලසුම් අදියර පුරාවට උනන්දුවක් දක්වන පාර්ශව උපදේශණය කරනු ඇත. එසේම ප්‍රජාවන්ට සහ දිළිඳු මිනිසුන්ට බලපෑ හැකි පාරිසරික, සමාජ සහ වෙනත් කාරණාවන් ඇතුළුව අදාල කාරණාවන් ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මකවන බව සහතික කරයි. |
| ව්‍යාපෘතිය ක්‍රියාවට නැන්වීම අතරතුර | බලපෑමට ලක්වූ පුද්ගලයින් සහ දේශීය ප්‍රජාව, දේශීය අධිකාරීන්, කේන්ද්‍රීය කණ්ඩායම්, සිවිල් සමාජ කණ්ඩායම්, සහ දේශීය සංගම් ව්‍යාපෘතිය සකස් කිරීමේ තාක්ෂණික සහාය (PPTA) ක්‍රියාත්මක කිරීම පුරාවට සියළුම අදාල ඇල්මැති පාර්ශව හඳුනාගෙන උපදේශණය කරනු ඇති අතර එය ව්‍යාපෘතිය මගින් සනාථ කරනු ඇත. |

**ව්‍යාපාරික අවස්ථාවන්**

| | |
|---|---|
| උපදේශණ සේවාවන් | සමස්ත වශයෙන් පුද්ගල-මාස 4 ක් සඳහා අන්තර්ජාතික පුද්ගලික උපදේශකයින් දෙදෙනෙකු සහ සමස්ත වශයෙන් පුද්ගල-මාස 15 ක් සඳහා දේශීය පුද්ගලික උපදේශකයින් හය දෙනෙකුගේ සහාය ලබාගැනීමට සූදානම්ය. උපදේශකයින් යෙදවීම සඳහාවන ආසියානු සංවර්ධන බැංකුවේ සහ එහි ණය ගැණුම්කරුවන්ගේ මගපෙන්වීම අනුව සියළුම උපදේශකයින් බඳවා ගනු ඇත (2013, කලින් කලට සංශෝධනය කල පරිදි). |
| ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදනය සඳහාවන ආසියානු සංවර්ධන බැංකුවේ මගපෙන්වීම අනුව සියළුම භාණ්ඩ සහ වැඩකටයුතු ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙනු ඇත (2015, කලින් කලට සංශෝධනය කල පරිදි). |

**වගකිව යුතු නිළධාරී**

| | |
|---|---|
| ආ.ස.බැ වගකිව යුතු නිළධාරී | මුක්තෝර් කාමුද්කනොව් |
| ආ.ස.බැ වගකිව යුතු දෙපාර්තමේන්තුව | දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| ආ.ස.බැ වගකිව යුතු අංශය | බලශක්ති අංශය, දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| ක්‍රියාවට නැන්වීමේ නියෝජිත ආයතන | **විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය (MOPE)**<br>72, ආනන්ද කුමාරස්වාමි මාවත<br>කොළඹ 07, ශ්‍රී ලංකාව |

**කාලසටහන**

| | |
|---|---|
| සංකල්ප අනුමත කිරීම | - |
| තොරතුරු සෙවීම | - |
| කළමණාකරණ සමලෝචන රැස්වීම | - |
| අනුමැතිය | 2015 සැප්තැම්බර් 14 |
| අවසන් විමර්ශණ මෙහෙවර | - |
| ව්‍යාපෘති දක්ත පත්‍රය අවසන් වරට යාවත්කාලීන කරන ලද්දේ | 2016 මාර්තු 21 |

TA 8952-SRI

**ඉතා වැදගත් අවස්ථාවන් / සන්ධිස්ථාන**

| **අනුමැතිය** | **අත්සන් කල දිනය** | **බලාත්මක දිනය** | **නිම කිරීම** | | |
|---|---|---|---|---|---|
| | | | **ප්‍රථම** | **සංශෝධනය** | **සැබෑ** |
| 2015 සැප්තැම්බර් 14 | - | 2015 සැප්තැම්බර් 14 | 2016 මැයි 31 | - | - |

**මූල්‍ය සැලැස්ම /තාක්ෂණික සහාය භාවිතය**

**සමුච්චිත වියපැහැදිම් ගෙවීම**

| ආසියානු සංවර්ධන අරමුදල | සහය මූල්‍යකරණය | ප්‍රතිරූප අරමුදල් | | | | සමස්තය | දිනය | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|
| | | රජය | ප්‍රතිලාභ ලබන්නන් | ව්‍යාපෘති අනුග්‍රාහක | වෙනත් | | | |
| 225,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 225,000.00 | 2015 සැප්තැම්බර් 14 | 97,027.00 |

ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධ සාරාංශගත කරන ලද තොරතුරු ව්‍යාපෘති දත්ත පත්‍රවල අඩංගු වේ. ව්‍යාපෘති දත්ත පත්‍රිකාවක් යනු වැඩ කෙරෙමින් පවතින ව්‍යාපෘති සම්බන්ධ වාර්තාවක් බැවින් ඇතැම් තොරතුරු මෙහි පළමු පිටපත් වල ඇතුළත් නොවිය හැකි අතර එකී තොරතුරු ලැබෙන පරිදි ඇතුලත් කරනු ඇත. යෝජිත ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු තාවකාලික සහ හඟවන තොරතුරු වේ.

ආසියානු සංවර්ධන බැංකුව විසින් මෙම ව්‍යාපෘති දත්ත පත්‍රයේ සඳහන් තොරතුරු එය භාවිත කරන්නන් සඳහා උපකරණයක් ලෙස භාවිතා කිරීමට කිසිදු සහතිකවීමක් නොමැතිව සපයයි. ආසියානු සංවර්ධන බැංකුව විසින් ඉහළ ගුණාත්වයෙන් යුත් අන්තර්ගතයක් සැපයීමට සෑම විටම උත්සහ කරන අතර කිසිදු ආකාරයක වගකීමක් නොමැතිව, ප්‍රකාශිතව හෝ හැඟවීමෙන්, පණ්‍යයීය ආකාරයේ වගකීම් සීමාකම් නොමැතිවීම ඇතුළත්ව, නිශ්චිත අරමුණක් සඳහා ගැළපෙන පරිදි, උල්ලංඝනය නොවන ලෙස තොරතුරු "පෙනෙන පරිදි" සපයයි. මෙවන් ඕනෑම තොරතුරක නිරවද්‍යතාවය හෝ පරිපූර්ණත්වය පිළිබඳව ආසියානු සංවර්ධන බැංකුව විසින් විශේෂිතව ඕනෑම වගකීමක් සහ පෙනීසිටීමක් සිදුනොකරයි.